// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2117/32 – 2019 අප්‍රේල් 03 වැනි බදාදා – 2019.04.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/22/16/2005.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්:*
පී. ඒ. ඒ. ගුණතිලක මයා. 6 වන පටුමග, බුළුගහවත්ත, මල්කඩුවාව, කුරුණෑගල

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්*
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කළුතර, නාගොඩ, ශ්‍රී සෝභිත මාවත, අංක 242, ඕබඩගේ ලීලාරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මාර්තු මස 26 වැනි දින,
කොළඹ දී ය.

1A – G 29811 – 11 (2019/04)
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/22/16/2005.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්:*

පී. ඒ. ඒ. ගුණතිලක මයා. 6 වන පටුමග, බුළුගහවත්ත, මල්කඩුවාව, කුරුණෑගල

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

*ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,*

1. 1970 ජූලි මස 02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවයට බඳවා ගනු ලැබූ පී. ඒ. ඒ. ගුණතිලක මහතා වෙත ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවක මණ්ඩල කළමනාකරු විසින් නිකුත් කරනු ලැබූ 2002.09.25 දිනැති ලිපිය අනුව එම සේවකයාගේ මුල් පත්වීම වශයෙන් සැලකිය හැකි දිනය කුමක් විය යුතු ද?

2. එම මුල් පත්වීමේ දිනය අනුව පී. ඒ. ඒ. ගුණතිලක මහතා විශ්‍රාම ලැබිය යුතු වයස් සීමාව කුමක් විය යුතු ද?

3 පී. ඒ. ඒ. ගුණතිලක මහතා වයස අවුරුදු 55 සම්පූර්ණ වීම මත 2005.12.28 වන දින ක්‍රියාත්මක වන පරිදි සේවයෙන් විශ්‍රාම ගැන්වීමෙන් ඔහුට යම් අසාධාරණයක් සිදුවූයේද? අසාධාරණයක් වූයේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න, හා

4. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ 2004 අංක 02 දරන මුදල් කොට්ඨාස චක්‍රලේඛය පරිදි හිඟ වැටුප් ලබා ගැනීමට පී. ඒ. ඒ. ගුණතිලක මහතා හිමිකම් ලබන්නේ ද? එසේ නම්, ඔහුට ලැබිය යුතු හිඟ මුදල් ප්‍රමාණය කොපමණ ද යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 12 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

04 - 580

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.